# මාධ්‍ය නිවේදනය



සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk



ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2023.11.30 |


## ඉදිකිරීම් කටයුතු සඳහා වන ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය- ඔක්තෝබර් 2023

**ඉදිකිරීම් කටයුතු සඳහා වන සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය මාස විස්සක අඛණ්ඩ පහත වැටීමකින් අනතුරුව 2023 ඔක්තෝබර් මාසයේ දී දර්ශකාංක 50.0ක කඩඉම් මට්ටමට ළඟා විය.** මෙහිදී, රජය විසින් අත්හිටුවා තිබූ ඇතැම් ඉදිකිරීම් ව්‍යාපෘති සීමිත වශයෙන් නැවත ආරම්භ කරනු ලැබූ බව සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූ සමහරක් සඳහන් කරනු ලැබීය. කෙසේ වුවද, වර්තමානයේ ක්‍රියාත්මක බොහෝ ව්‍යාපෘති ඒවායේ අවසන් භාගයේ පවතින බැවින් සමස්තයක් වශයෙන් ඉදිකිරීම් කර්මාන්තයේ දැනට පවතින වැඩ ප්‍රමාණය අඩු මට්ටමක පවතී.

මේ අතරතුර, ඔක්තෝබර් මාසයේදී නව ඇණවුම් පසුගිය මාසයට සාපේක්ෂව අඩු වේගයකින් පහත වැටුණි. තවද, තරමක් ඉහළ වටිනාකම්වලින් යුත් ව්‍යාපෘති සඳහා වන ටෙන්ඩර් අවස්ථා ක්‍රමයෙන් ඉහළ යාමක් දක්නට ලැබෙන බව සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූ බොහෝ දෙනෙක් සඳහන් කරන ලද අතර, ඉන් බොහොමයක් ඉදිරි වසරේ ප්‍රථම භාගයේ දී වැඩ අරම්භ කිරීමට නියමිත ව්‍යාපෘති වේ. පවතින තත්ත්වය මත, ඉදිකිරීම් සමාගම් සීමිත සේවක සංඛ්‍යාවකින් සිය කටයුතු කරගෙන යාම හේතුවෙන් සේවා නියුක්තිය ද තවදුරටත් පහත මට්ටමක පැවතුනි. තවද, බලශක්තිය ආශ්‍රිත වියදම් ඉහළ යාම සිය කටයුතුවලට අහිතකර ලෙස බලපා ඇති බව ප්‍රතිචාර දක්වන්නන් ප්‍රකාශ කරන ලදී. මේ අතරතුරදී, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ඔක්තෝබර් මාසය තුළදී සුළු වශයෙන් ඉහළ යන ලදී.

| විචල්‍යය | සැප් | ඔක්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **සමස්ත ක්‍රියාකාරකම්** | **44.3** | **50.0** | + | **පහළ යෑමක සිට කඩඉම් මට්ටමට ළඟා වීමක්** |
| නව ඇණවුම් | 45.7 | 48.6 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 35.7 | 36.1 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 42.9 | 44.4 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 48.6 | 51.4 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වෙමින් පැවතීම සහ ව්‍යාපෘති කටයුතුවල බලාපොරොත්තුවන වර්ධනය හේතුවෙන් ඉදිරි මාස තුන තුළ ඉදිකිරීම් කර්මාන්තය සඳහා වන අපේක්ෂා ඉහළ මට්ටමක පවතියි. කෙසේවුවද, බලශක්තිය හා ආශ්‍රිත වියදම් ඉහළ යාමේ ප්‍රවනතාවය සහ සිදුකිරීමට නියමිත බදු සංශෝධන මගින් ඉදිකිරීම් කර්මාන්තයට ඇතිවිය හැකි අහිතකර බලපෑම් පිළිබඳ ප්‍රතිචාර දක්වන්නන් අවධාරණය කරන ලදී.

**සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය**
**50.0**
**2023 ඔක්තෝබර්**

### ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය[1]

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගය පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

### විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්

සමස්ත ක්‍රියාකාරකම්: ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල සමස්ත පරිමාව. මෙය ජාත්‍යන්තර ක්‍රමවේදය අනුගමනය කරමින් "ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය" ලෙස හඳුන්වන මූලික දර්ශකය වන අතර එය කර්මාන්ත අංශයේ නිෂ්පාදන දර්ශකය සහ සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය හා සැසඳිය හැකි වේ.

සේවා නියුක්තිය: සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන.

තොග මිලදී ගැනුම්: නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගෙන ගබඩා කර තැබීම.

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය: සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය.

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.

### සමීක්ෂණ ප්‍රතිචාර

මාසික ප්‍රතිචාර 35ක් පමණ ආවරණය වන පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිව ඇති ඉහළම ශ්‍රේණිගත දේශීය ඉදිකිරීම් සමාගම් ඉලක්ක කර ගනිමින් පසුගිය මාසයට සාපේක්ෂව අදාල මාසයේ දී ඉදිකිරීම් කටයුතු වල ප්‍රවණතා ග්‍රහණය කරගැනීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි.

[1] ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කර ඇත්තේ ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සම්පාදකයා ලෙස හඳුනාගෙන ඇති ලොව පුරා ආර්ථිකයන් 40කට අධික සංඛ්‍යාවක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සම්පාදනය කරනු ලබන එස්&පී ග්ලෝබල් (S&P Global) අනුගමනය කරනු ලබන ක්‍රමවේදය භාවිතයෙනි.